# ගා/ මාපලගම සිරිසුනන්ද මහා විද්‍යාලය

## පුරවැසි අධ්‍යාපනය

6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2022 | කාලය පැය - 1. වි 30

නම: .......................................................................................................................................................

- 01 සිට 05 දකවා නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. ජාතියට පාසලෙන් සිදුවන මෙහෙය පිළිබඳ සිතුවිලි දරුවා තුළ ජනිත කිරීම සිදුවන්නේ,
(1) පාසැල් කොඩිය තුළින් (2) පාසල් ලාංඡනය තුළින්
(3) පාසල් ගීතය තුළින් (4) පාසලේ මෙහෙවර ප්‍රකාශය තුළින්

02. පාසල් පාලනයට සම්බන්ධ ප්‍රධාන නිලය කුමක් ද?
(1) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (2) අධ්‍යාපන ඇමතිවරයා
(3) කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ (4) විදුහල්පතිවරයා

03. පුද්ගලයෙකු සතු දුර්වලතාවයක් නොවන්නේ,
(1) විනයගරුක බව (2) කළහකාරී බව
(3) ආත්මාර්ථකාමී බව (4) ඉවසීම නැතිකම

04. පහත සඳහන් ඒවා අතරින් පාසල් සංස්කෘතියට අයත් නොවන්නේ කුමක් ද?
(1) පාසල් නීතිරීති (2) පාසල පිහිටා ඇති ඉඩම
(3) පාසලේ සම්ප්‍රදායන් (4) පාසලේ සිරිත් විරිත්

05. පහත සඳහන් ඒවා අතුරින් ඔබ සතු යුතුකමක් වන්නේ,
(1) අධ්‍යාපනය ලැබීම (2) අනන්‍යතාව රැක ගැනීම
(3) අදහස් ප්‍රකාශ කිරීම (4) සමානාත්මතාවයෙන් කටයුතු කිරීම

- 06 සිට 10 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ දක්වන්න.

06. ඔබ ජීවත්වන පරිසරය ආරක්ෂා කිරීමට දායක වීම ඔබෙන් ඉටුවිය යුතු අයිතිවාසිකමකි. ( )
07. පාසලක ශිෂ්‍ය සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව අනුව පාසලේ සංවිධාන ව්‍යුහය වෙනස් විය හැක. ( )
08. ආරක්ෂාවට ලැබෙන අයිතිය පාසල් සිසුවෙකු ලෙස ඔබට ලැබෙන යුතුකමකි. ( )
09. පාසල් සමාජය විවිධත්වයෙන් යුක්ත නොවේ. ( )
10. පාසලේදී සහයෝගයෙන් කටයුතු නොකළ යුතුය. ( )

- ගැලපෙන පිළිතුර ඊ කොටසින් තෝරා වරහන තුළ ලියන්න.

| A | | B |
|---|---|---|
| 11. රාජ්‍ය ඔසුසල පිහිටුවීම. | ( ) | (a) සී.ඩබ්.ඩබ්. කන්නංගර මැතිතුමා |
| 12. ගුරු ඇගයීම් කටයුතු කිරීම. | ( ) | (b) අධ්‍යාපනය ලැබීම |
| 13. ප්‍රථම අධ්‍යාපන ඇමතිතුමා | ( ) | (c) පාසල් කොඩිය |
| 14. පාසලක අනන්‍යතාව පෙන්වයි. | ( ) | (d) පාසලේ සම්ප්‍රදායන් |
| 15. අයිතිවාසිකමකි. | ( ) | (e) විදුහල්පතිවරයා |
| | | (f) සේනක බිබිලේ මහතා |

- නිවැරදි පිළිතුර තිත් ඉරිමත ලියන්න.

16. ජීවිතයේදී සෑම පුද්ගලයෙකුටම ................................................ වලට මුහුණ දීමට සිදු වේ.
17. පාසල් සංවර්ධන කමිටුවක සභාපතිත්වය දරන්නේ ................................................ යි.
18. රැකවරණය සහිත වාතාවරණයක සුරක්ෂිත වූ පවිත්‍ර පරිසරයක සෞඛ්‍යාරක්ෂිත පහසුකම් ඇති පාසල් ................................................ ලෙස හැඳින්වේ.

19. ඉතිහාසය ගැන අපට දැනුම ලබා දීමට උපයෝගීවන සෑම දෙයක්ම .................................................. ලෙස හැඳින්වේ.
20. අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත ආදිය .................................................. අයත් වේ.

II කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. (i) පාසල් සංවිධාන ව්‍යුහයට අයත් භූමිකා දෙකක් ලියන්න.
    (ii) පාසල් සංවිධාන ව්‍යුහය තුළ ඇති වෙනත් සංවිධාන හතරක් නම් කරන්න.
    (iii) ඔබේ පාසලේ, (අ) විදුහල්පතිතුමාගේ කාර්ය කුමක් ද?
    (ආ) ගුරු මණ්ඩලයේ කාර්ය කුමක් ද?
    වෙන වෙනම ලියා දක්වන්න.

02. (i) පුද්ගලයෙකු තුළ ඇති දක්ෂතා දෙකකට නිදසුන් ලියන්න.
    (ii) ඔබ සතුව ඇති හොඳ ගති ලක්ෂණ හතරක් ලියන්න.
    (iii) සී.ඩබ්.ඩබ්. කන්නංගර මහතා තම දක්ෂතා තුළින් ජීවිතය ජයගත් ආකාරය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

03. (i) පුද්ගලයෙකු තුළ ඇති දුර්වලතා දෙකක් සඳහන් කරන්න.
    (ii) දුර්වලතා අවම කර ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දෙකක් ලියා දක්වන්න.
    (iii) ජීවිත අභියෝගවලට මුහුණ දී දිවිය ජයගත් පුද්ගලයකු ලෙස සේනක බිබිලේ මහතා පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න.

04. (i) සැලසුම්කරණය යනු කුමක් ද?
    (ii) සැලසුම්කරණය තුළින් අත්වන වාසි හතරක් දක්වන්න.
    (iii) සැලසුම්සහගත ශිෂ්‍යයෙකු හා එසේ නොවන ශිෂ්‍යයෙකු අතර ඇති වෙනස්කම් තුනක් ලියා දක්වන්න.

05. (i) පාසල මගින් අවට ප්‍රජාවට ලබාදෙන පණිවුඩ දෙකක් ලියන්න.
    (ii) ළමා මිතුරු පාසල් පරිසරයක දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් දක්වන්න.
    (iii) (අ) පාසලෙන් සමාජයට සැපයෙන සේවා තුනක්
    (ආ) සමාජයෙන් පාසලට සැපයෙන සේවා තුනක් වෙන වෙනම ලියා දක්වන්න.